බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
புத்தசாசனம், மத மற்றும் கலாசார அலுவல்கள் அமைச்சு
Ministry of Buddhasasana, Religious and Cultural Affairs
සංස්කෘතික අංශය கலாசார பிரிவு Cultural Division

8 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. 8 ஆம் மாடி, செத்சிறிபாய பத்தரமுல்லை, ஸ்ரீ லங்கா
8th Floor, Sethsiripaya, Battaramulla, Sri Lanka

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No. | සීඒ/6/1/10/6/1 | ඔබේ අංකය<br>உமது இல<br>Your No. | | දිනය<br>திகதி<br>Date. | 2024.06.20 |

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>අන්තර් රාජ්‍ය සේවක නිර්මාණ තරගාවලිය -2024</u>**

රාජ්‍ය ආයතනවල සේවයේ නිරත නිලධාරීන්ගේ නිර්මාණ හැකියාව ඔප් නැංවීම, ඇගයීම සහ එම නිර්මාණ එළි දැක්වීමේ අවස්ථාව උදා කිරීම සහ එමගින් රාජ්‍ය ආයතනවල සංස්කෘතික කටයුතු ප්‍රවර්ධනය කිරීමේ අරමුණෙන් බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය මෙවරද අන්තර් රාජ්‍ය සේවක නිර්මාණ තරගාවලිය පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත.

**01. <u>තරඟ අංශ</u>**

1.1 කෙටි කතා
1.2 ගීත රචනා
1.3 පද්‍ය රචනා
1.4 ළමා සාහිත්‍ය නිර්මාණ
1.5 කෙටි නාට්‍ය
1.6 චිත්‍ර නිර්මාණ
1.7 කෙටි චිත්‍රපට
1.8 ඡායාරූප

**02. <u>පොදු කොන්දේසි</u>**

2.1 අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු ඇතුළු රාජ්‍ය සේවයේ හා අර්ධ රාජ්‍ය සේවයේ නිරත ඕනෑම අයෙකුට මෙම තරගාවලියට ඉදිරිපත් විය හැකි අතර, බුද්ධශාසන, ආගමික හා සංස්කාතික කටයුතු අමාත්‍යාංශයේ ප්‍රධාන ශාඛාවේ නිලධාරීන්ට හැර අනුබද්ධ සියලුම ආයතනවල නිලධාරීන්ට ද මේ සඳහා සහභාගී විය හැකි බව කාරුණිකව සඳහන් කරමි.

2.2 අයදුම්පත්‍රයේ හැර නිර්මාණයෙහි තරඟකරුවන්ගේ නම හෝ ආයතනය පිළිබඳ හෝ කිසිදු සඳහනක් අන්තර්ගත නොකළ යුතු වේ. කිසියම් හෙයකින් එසේ යම් සඳහනක් අදාළ කෙටි කතාව, ගීත රචනා, පද්‍ය රචනා, ළමා නිර්මාණ, නාට්‍ය අත් පිටපත, කෙටි චිත්‍රපටය, ඡායාරූපය හා චිත්‍රයෙහි අන්තර්ගත වී නම් එම නිර්මාණය ප්‍රතික්ෂේප කරනු ලැබේ.

දුරකථන අංකය / தொலைபேசி இல / Telephone No.
අමාත්‍ය / அமைச்சர் / Minister: 011-2861147
ෆැක්ස් / தொலைநகல் / Fax.: 011-2861107
ලේකම් / செயலாளர் / Secretary: 011-2861108
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2872004
ඊමේල් / மின்னஞ்சல் / E-mail.: culturalsecoffice@gmail.com
කාර්යාලය / அலுவலகம் / Office: 011-2872001, 011-2876586, 011-2872023
ෆැක්ස් / தொலைநகல் / Fax.: 011-2872024
ඊමේල් / மின்னஞ்சல் / E-mail.: culturalmin@gmail.com
වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site.: www.cultural.gov.lk

2.3 යොමු කරන නිර්මාණ ස්වතන්ත්‍ර විය යුතු අතර පරිවර්තන හෝ අනුවර්තන නොවිය යුතුය.

2.4 කිසියම් ජාතියකට, ආගමකට සහ ප්‍රසිද්ධ පුද්ගලයන්ගේ චරිතයට අපහාස වන පරිද්දෙන් හෝ යම් පුද්ගලයකු හෝ පිරිසක් පීඩාවට හෝ අපහසුතාවයට පත් කරන හෝ රජය හෝ රජයේ ප්‍රතිපත්ති විවේචනය කෙරෙන පරිදි නිර්මාණයක් ඉදිරිපත් නොකළ යුතු අතර, එවැනි නිර්මාණ ප්‍රතික්ෂේප කරනු ලැබේ. ජාතික සමගිය හෝ ආගමික සහජීවනයට බාධා වන කිසිදු නිර්මාණයක් බාර ගනු නොලැබේ. යම් හෙයකින් මෙවැනි නිර්මාණයක් තරගය සඳහා ඉදිරිපත් කිරීමෙන් යම් ගැටලුවක් ඇති වුවහොත් ඒ සම්බන්ධයෙන් සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය කිසිදු වගකීමට නොබැඳෙන අතර, එහි සම්පූර්ණ වගකීම අදාළ නිර්මාණකරු සතුවේ.

2.5 කෙටි කතා, ගීත රචනා, පද්‍ය රචනා, ළමා නිර්මාණ, කෙටි නාට්‍ය තරගාවලින් පමණක් අයදුම් කිරීමේදී සිංහල හා දෙමළ භාෂා මාධ්‍යයෙන් පැවැත්වේ.

2.6 ප්‍රමාද වී ලැබෙන සහ තරග කොන්දේසිවලට පටහැනි නිර්මාණ පෙර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

2.7 අන්තර් රාජ්‍ය සේවක නිර්මාණ තරගාවලිය පිළිබඳ සියලුම ප්‍රතිපත්තිමය තීරණ හා අවසාන වගකීම සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සතුවේ.

## 03. <u>නිර්මාණ ඉදිරිපත් කිරීම</u>

3.1 මේ සමඟ ඇති ආදර්ශ ආකෘතියට අනුව ඉල්ලුම් පත්‍රය නියමිත පරිදි සම්පූර්ණ කර ආයතන ප්‍රධානීගේ නිර්දේශ සමඟ නිර්මාණය ඉදිරිපත් කළ යුතුය. ආයතන ප්‍රධානීන්ගේ නිර්දේශය, නිල මුද්‍රාව හා අත්සන රහිත නිර්මාණ බාර ගනු නොලැබේ.

3.2 ඉදිරිපත් කරනු ලබන සියලුම නිර්මාණ ලේකම්, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය, 08 වන මහළ, සෙත්සිරිපාය I අදියර, බත්තරමුල්ල යන ලිපිනයට 2024.08.31 දිනට පෙර තැපැල් මාර්ගයෙන් එවීමට හෝ අතින් ගෙනවිත් අමාත්‍යාංශයේ ප්‍රවර්ධන අංශයට බාර දීමට කටයුතු කළ යුතු අතර ලියුම් කවරයේ වම් පස කෙළවර " **අන්තර් රාජ්‍ය සේවක නිර්මාණ තරඟාවලිය - 2024 (තරග අංශය)** " යනුවෙන් සඳහන් කළ යුතුය

## 04. <u>තරඟ විනිශ්චය</u>

4.1 කෙටි කතාව, ගීත රචනා, පද්‍ය රචනා, ළමා නිර්මාණ, කෙටි නාට්‍ය තරඟාවලිය සිංහල හා දෙමළ මාධ්‍යයෙන් වෙන් වෙන් වශයෙන් පැවැත්වෙන අතර, කෙටි චිත්‍රපට, චිත්‍ර හා ඡායාරූප තරගාවලිය සිංහල හා දෙමළ මාධ්‍යයෙන් වෙන් වෙන් වශයෙන් නොපැවැත්වේ.

4.2 ප්‍රවීණ විද්වත් විනිශ්චය මණ්ඩලයක් විසින් නිර්මාණ විනිශ්චය කරනු ලබන අතර, විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

4.3 නියමිත ප්‍රමිතියට අනුකූල නිර්මාණ මෙම තරගය සඳහා නොලැබුණ හොත් මෙම තරගයට නියමිත ත්‍යාග, සහතික හෝ සම්මාන නම් නොකර සිටීමට විනිශ්චය මණ්ඩලයට පූර්ණ අයිතිය හිමිවේ.

4.4 තරඟ කොන්දේසිවලට පටහැනි අයුරින් නිර්මාණයක් ඉදිරිපත් කර ඇති බව සනාථ වුවහොත් සම්මාන ලබා දීමෙන් පසුවද එම ජයග්‍රහණ අවලංගු කර සම්මාන නැවත කැඳවීමට කටයුතු කෙරේ. තරග කොන්දේසි කඩකරන නිර්මාණකරුවන් අසාදු ලේඛනගත කිරීමට (Black List) කටයුතු කරනු ලැබේ.

**05.සාහිත්‍ය තරගාවලිය**

5.1.තරග කොන්දේසි

5.1.1 ගීත රචනා, පද්‍ය රචනා, කෙටිකතා A4 ප්‍රමාණයේ කඩදාසිවල තනි පැත්තේ පරිගණක ගත කර තිබිය යුතු ය. සියලුම නිර්මාණ එෆ්එම් අභය අක්ෂරයෙන් පරිගණක ගත කළ යුතු වේ. ගීත රචනා, පද්‍ය රචනා, කෙටිකතා සඳහා අක්ෂරයේ ප්‍රමාණය ඒකක 12 විය යුතු ය. ළමා නිර්මාණ සඳහා අක්ෂරයේ ප්‍රමාණය ඒකක 16ක් විය යුතු ය.

5.1.2 මේ සමඟ ඇති ආදර්ශ ආකෘතියට අනුව ඉල්ලුම් පත්‍රය නියමිත පරිදි සම්පූර්ණ කර ආයතන ප්‍රධානිගේ නිර්දේශය සමඟ නිර්මාණ ඉදිරිපත් කළ යුතුය. ආයතන ප්‍රධානින්ගේ නිර්දේශය, නිල මුද්‍රාව හා අත්සන රහිත නිර්මාණ බාර ගනු නො ලැබේ.

5.1.3 ජයග්‍රාහී ගීත නිර්මාණවල පූර්ණ අයිතිය නිර්මාණ ශිල්පියා සතු වන අතර ඒවායේ ප්‍රචාරණ අයිතිය සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සතුවේ.

5.1.4 සෑම නිර්මාණයක් සමඟම වෙන වෙනම ඉල්ලුම් පත්‍රය බැගින් අමුණා එවිය යුතු අතර, එක් තරග අංශයකින් එක් නිර්මාණයක් පමණක් බාරගනු ලැබේ.

- සාහිත්‍යය

- කෙටිකතා
  - වචන 2000ක උපරිමයකට යටත් විය යුතු ය.
- ගීත රචනා
  - මිනිත්තු 3- 3 1/2 අතර ගැයෙන ගීතයකට යෝග්‍ය ගේය පද මාලාවක් විය යුතු ය.
- පද්‍ය රචනා
  - සඳැස් පද්‍ය රචනාවකදී පද්‍ය රචනය තුළ අඩංගු කාව්‍ය කොටස් උපරිම ලෙස දහයකට සීමා විය යුතු ය.

ඉහත තරග සඳහා ඕනෑම තේමාවක් යටතේ නිර්මාණ ඉදිරිපත් කළ හැකි ය.

- **ළමා නිර්මාණ (ළමුන් සඳහා වන සාහිත්‍ය නිර්මාණ)**

I. ළමා කතා පොතක් හෝ ළමා ගී පොතක් චිත්‍ර ද සමඟ නිර්මාණය කළ යුතු ය.

II. වයස අවුරුදු 10ට අඩු ළමුන් සඳහා උචිත වන ධනාත්මක සිතිවිලිවලින් ළමා මනස සංවර්ධනය වන ආකාරයේ තේමාවක් රැගත් නිර්මාණ සරල බස් වහරින් ඉදිරිපත් කළ යුතු ය.

III. ඉලක්ක කණ්ඩායම වයස අවුරුදු 5 - 7 අතර දරුවන් සඳහා නම් උපරිමය පිටු 16ක් විය යුතු අතර වයස අවුරුදු 8 - 10 අතර දරුවන් සඳහා නම්, අවමය පිටු 16ක් සහ උපරිමය පිටු 32ක් විය යුතු ය.

## 5.2 සාහිත්‍ය තරඟ සඳහා පිරිනමන මුදල් තිළිණ හා සම්මාන

| තරග අංශය | ස්ථානය | ත්‍යාග මුදල (රු) |
|---|---|---|
| කෙටි කතා<br>ගීත රචනා<br>පද්‍ය රචනා | ප්‍රථම ස්ථානය | 20,000.00 |
| | දෙවන ස්ථානය | 15,000.00 |
| | තෙවන ස්ථානය | 10,000.00 |
| | කුසලතා ස්ථාන 05 ක් බැගින් තෝරා ගනු ලැබේ. | එක් ජයග්‍රාහකයකුට 5000.00 බැගින් |

## 5.3. ළමා සාහිත්‍ය නිර්මාණ සඳහා පිරිනමන මුදල් තිළිණ හා සම්මාන

| තරග අංශය | ස්ථානය | ත්‍යාග මුදල (රු) |
|---|---|---|
| ළමා සාහිත්‍ය නිර්මාණය | ප්‍රථම ස්ථානය | 20,000.00 |
| | දෙවන ස්ථානය | 15,000.00 |
| | තෙවන ස්ථානය | 10,000.00 |
| | කුසලතා ස්ථාන 05 ක් බැගින් තෝරා ගනු ලැබේ. | එක් ජයග්‍රාහකයකුට 5000.00 බැගින් |
| ළමා සාහිත්‍ය චිත්‍ර නිර්මාණය | ප්‍රථම ස්ථානය | 20,000.00 |
| | දෙවන ස්ථානය | 15,000.00 |
| | තෙවන ස්ථානය | 10,000.00 |
| | කුසලතා ස්ථාන 05 ක් බැගින් තෝරා ගනු ලැබේ. | එක් ජයග්‍රාහකයකුට 5000.00 බැගින් |

## 06. කෙටි නාට්‍ය

### 6.1 තරඟ කොන්දේසි

6.1.1 තරඟය සඳහා අත්පිටපත් කැඳවීම දීපව්‍යාප්තව සිදු කරනු ලබන අතර, ඉදිරිපත් කරනු ලබන අත් පිටපත් , සමීක්ෂණ මණ්ඩලයක් වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව වේදිකාගත කිරීම සඳහා සුදුසු අත් පිටපත් ලකුණු ප්‍රමුඛතාවය මත සුදුසු කෙටි නාට්‍ය 10 ක් තෝරා ගනු ලැබේ.

6.1.2 පසුතල නිර්මාණය, රංග වස්ත්‍ර නිර්මාණය, රංගාලෝකකරණය, සංගීත නිර්මාණය, රංග වින්‍යාසය, වේදිකා පරිපාලනය, අංගරචනය, රංගනය, පිටපත් රචනය සහ අධ්‍යක්ෂණය යන අංශ සඳහා ද ලකුණු ලබා දීම සිදු වේ.

6.1.3 නාට්‍යයේ පසුතල නිර්මාණය, රංග වස්ත්‍ර නිර්මාණය, රංගාලෝකකරණය, සංගීතය සහ අංගරචනය යන අනුශාංගික අංශ සඳහා පමණක් රාජ්‍ය සේවයට අයත් නොවන පුද්ගලයන් යොදවා ගැනීමට අවසර ඇතත්, ඔවුන් සම්මාන ලැබීමට හිමිකම් නොලබති. එසේ වුවත් නළු නිළියන්, පිටපත් රචකයා, නාට්‍යයේ අධ්‍යක්ෂකවරයා රාජ්‍ය සේවකයන් විය යුතුය.

6.1.4 එක් නාට්‍යයක් සඳහා එකම ආයතනයක් මගින් සමස්ත ශිල්පීන් ඉදිරිපත් වීම අත්‍යවශ්‍ය නොවන අතර, ඒ සඳහා සුදුසුකම් සපුරා ඇති ඕනෑම රාජ්‍ය සේවකයකුහට ඉදිරිපත් වීමට අවස්ථාව ඇත. එසේ වුවද ලිපි ගනුදෙනු සිදු කෙරෙනුයේ නාට්‍යයේ අධ්‍යක්ෂක අයත් ආයතනය සමග පමණිකි.

6.1.5 එක් තරගකරුවෙකුට ඕනෑම අනුශාංගික අංශයක් යටතේ දායක විය හැක්කේ එක් නාට්‍යයක් සඳහා පමණි.

6.1.6 තරගයට ඉදිරිපත් කරනු ලබන නාට්‍යය 2024 වර්ෂයේ නිෂ්පාදිත නාට්‍යයක් විය යුතු අතර, ඊට පෙර වර්ෂවල මහජන ප්‍රදර්ශන හෝ නාට්‍ය තරඟවලින් ජයග්‍රහණය නොකළ නාට්‍යයක් විය යුතුය.

6.1.7 අත් පිටපත් සමීක්ෂණයෙන් වේදිකාගත කිරීමට නිර්දේශ වන නාට්‍ය වේදිකා ගත කිරීමට පෙර ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලයේ බලපත්‍රය අනිවාර්යයෙන්ම ලබා ගත යුතුය. තරඟය

පැවැත්වෙන දිනයේ ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලයේ සහතිකයේ පිටපතක් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ යුතුය.එසේ ඉදිරිපත් කිරීමට අපොහොසත්වන නාට්‍ය තරගයෙන් ඉවත් කිරීමට සිදුවේ.

6.1.8 නාට්‍ය තරඟයේදී නාට්‍යයක් නියමිත දිනක නියමිත ස්ථානයක ප්‍රදර්ශනය කරන බවට එකඟව සිටියදී එය ප්‍රදර්ශනය කිරීමට අසමත් වන්නේ නම් අදාළ නාට්‍ය අධ්‍යක්ෂ තම කැමැත්තෙන් නාට්‍යය තරඟයෙන් ඉවත් කර ගත් සේ සලකනු ලැබේ. එසේම තම නාට්‍යය නියමිත දිනට ප්‍රදර්ශනය කිරීමට නොහැකි නම් අවම වශයෙන් සතියකට පෙර ඒ බව දැනුම් දීම නාට්‍ය අධ්‍යක්ෂගේ වගකීම වේ.

6.1.9 මෙම තරගයට සහභාගී වීමට හිමිකම් නොමැති කවර හෝ පුද්ගලයෙක් තම නාට්‍යයට මැදිහත් කර නොගැනීමට තරගයට ඉදිරිපත් කරන නාට්‍ය අධ්‍යක්ෂවරයා වග බලා ගත යුතුය. එවැනි පුද්ගලයෙකු නාට්‍යයට මැදිහත් වූ බවට සෑහීමට පත් විය හැකි අවස්ථාවල එම නාට්‍ය සම්පූර්ණයෙන්ම තරගයෙන් ඉවත් කිරීමට අමාත්‍යාංශයේ ලේකම්ට හෝ බලය පැවරෙනු මාණ්ඩලික නිලධාරියකුට බලය ඇත.

6.1.10 තරගය සඳහා ඉදිරිපත් වන සෑම තරගකරුවෙක්ම සහභාගී වන අවස්ථාවේදී, තමන් රාජ්‍ය සේවයේ ස්ථිර වැටුප් හිමි තනතුරක සේවය කරන බවට තමන් සේවය කරන ආයතනයේ ප්‍රධානියා විසින් සහතික කරන ලිපියක් ඉදිරිපත් කල යුතුය. තම ජාතික හැඳුනුම්පත ද අනිවාර්යයෙන්ම ඉදිරිපත් කල යුතුය.

6.1.11 චක්‍රලේඛනයට ප්‍රකාරව මෙම තරගය සඳහා සහභාගී වීමට සුදුසුකම් ලබන්නකු එය සනාථ කිරීමේ වගකීම දැරිය යුතු අතර, අදාල තොරතුරු ඉල්ලා සිටින අවස්ථාවක ඉදිරිපත් කිරීමටත් සූදානම්ව සිටිය යුතුය. අමාත්‍යාංශයේ ලේකම් හෝ අධිකාරිය පැවරෙන මණ්ඩලික නිලධාරියකු සෑහීමට පත්වන අයුරින් එම තොරතුරු ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම සම්පූර්ණ නාට්‍යම තරගයෙන් ඉවත් කිරීමට හේතුවක් වනු ඇත.

6.1.12 අන්තර් රාජ්‍ය සේවක කෙටි නාට්‍ය තරඟාවලියේ කොන්දේසි කඩකිරීමක් පිළිබඳ පැමිණිල්ලක් වේ නම් නාට්‍ය රඟ දක්වා දින 03 ක් ගත වීමට පෙර එය ඉදිරිපත් කළ යුතුය. ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසුව කරනු ලබන පැමිණිලි ප්‍රතික්ෂේප කෙරේ.

6.1.13 එසේම පැමිණිල්ල ඉදිරිපත් කරන විට එය ඉදිරිපත් කරන අය සිය අනන්‍යතාව සහිතව පැමිණිල්ල ඉදිරිපත් කළ යුතු අතර නිර්නාමිකව ඉදිරිපත් කරන පැමිණිලි ප්‍රතික්ෂේප කිරීමට කටයුතු කෙරේ.

6.1.14 කෙටි නාට්‍ය තරඟය සඳහා තෝරා ගනු ලබන නාට්‍ය පිළිබඳ යම් අයිතිවාසිකම් පෑමක් හෝ විරෝධය පෑමක් සිදු කරන්නේ නම් එය දිවුරුම් ප්‍රකාශයක් මගින් විධිමත්ව සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ යුතුය

6.1.15 ඉහත 6.1.13 , 6.1.14 යන වගන්ති ප්‍රකාරව ලැබුණු පැමිණිල්ලක හෝ අයිතිවාසිකම් පෑමක හෝ විරෝධය පෑමක් සාධාරණභාවය පිළබඳ සෑහීමට පත් විය හැකි අවස්ථාවල සම්මාන ප්‍රදානෝත්සවයෙන් පසුව වුවත් අදාල නාට්‍යය / නාට්‍ය සම්පූර්ණයෙන් තරගයෙන් ඉවත් කිරීමට, ලබා දුන් සම්මාන , සහතික පත්‍ර, ත්‍යාග නැවත අය කර ගැනීමටත් අමාත්‍යාංශ ලේකම්ට හෝ අධිකාරිය පැවරුණු මාණ්ඩලික නිලධාරියකුට හෝ බලය ඇත.

6.1.16 නොවැළැක්විය හැකි හේතූන් මත හෝ ප්‍රමාණවත් අත්පිටපත් සංඛ්‍යාවක් නොලැබීම මත හෝ ඉදිරිපත් වී ඇති නාට්‍ය ගුණාත්මක අතින් දුර්වලවීම හෝ අවස්ථානුගත හේතූන් මත මෙම නාට්‍ය තරගය නොපැවැත්වීමට , කල් දැමීමට සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයට තීරක බලය ඇත.

6.1.17 කෙටි නාට්‍ය අත්පිටපත් A4 ප්‍රමාණයේ කඩදාසිවල තනි පැත්තේ පරිගණක ගතකර තිබිය යුතුය. එම අත් පිටපත් පරිගණක ගත කළ යුතු අතර, අක්ෂරයේ ප්‍රමාණය ඒකක 12 ක් විය යුතුය.

## 6.2 <u>කෙටි නාට්‍ය තරඟ සඳහා පිරිනමන මුදල් තිළිණ හා සම්මාන</u>

| අනු අංකය | සම්මාන | ත්‍යාග මුදල් (රු) |
|---|---|---|
| 6.2.1 | වසරේ ප්‍රශස්තම පසුතල නිර්මාණය | 10,000.00 |
| 6.2.2 | වසරේ ප්‍රශස්තම රංග වස්ත්‍ර නිර්මාණය | 10,000.00 |
| 6.2.3 | වසරේ ප්‍රශස්තම සංගීත නිර්මාණය | 10,000.00 |
| 6.2.4 | වසරේ ප්‍රශස්තම රංග වින්‍යාසය | 10,000.00 |

| | | |
|---|---|---|
| 6.2.5 | වසරේ ප්‍රශස්තම අංග රචනය | 10,000.00 |
| 6.2.6 | වසරේ ප්‍රශස්තම වේදිකා පරිපාලනය | 10,000.00 |
| 6.2.7 | වසරේ ප්‍රශස්තම රංගාලෝකකරණය | 10,000.00 |
| 6.2.8 | වසරේ ප්‍රශස්තම කෙටි නාට්‍ය සහය නිළිය | 10,000.00 |
| 6.2.9 | වසරේ ප්‍රශස්තම කෙටි නාට්‍ය සහය නළුවා | 10,000.00 |
| 6.2.10 | වසරේ ප්‍රශස්තම කෙටි නාට්‍ය නිළිය | 15,000.00 |
| 6.2.11 | වසරේ ප්‍රශස්තම කෙටි නාට්‍ය නළුවා | 15,000.00 |
| 6.2.12 | ජූරියේ විශේෂ සම්මානය ( උපරිම 2 යි ) | 5,000.00 බැගින් |
| 6.2.13 | කෙටි නාට්‍ය රචනය තෙවන ස්ථානය | 10,000.00 |
| 6.2.14 | කෙටි නාට්‍ය රචනය දෙවන ස්ථානය | 15,000.00 |
| 6.2.15 | වසරේ ප්‍රශස්තම කෙටි නාට්‍ය රචනය ප්‍රථම ස්ථානය | 20,000.00 |
| 6.2.16 | කෙටි නාට්‍ය අධ්‍යක්ෂණය තෙවන ස්ථානය | 10,000.00 |
| 6.2.17 | කෙටි නාට්‍ය අධ්‍යක්ෂණය දෙවන ස්ථානය | 15,000.00 |
| 6.2.18 | වසරේ ප්‍රශස්තම කෙටි නාට්‍ය අධ්‍යක්ෂණය ප්‍රථම ස්ථානය | 20,000.00 |
| 6.2.19 | වසරේ විශිෂ්ඨතම කෙටි නාට්‍ය | 25,000.00 |

### 6.2.3 අයදුම් කිරීම

තරඟය සඳහා අත්පිටපත් ඉදිරිපත් කිරීමේ දී එය නාට්‍යයේ අධ්‍යක්ෂ විසින් ඉදිරිපත් කළ යුතු අතර පහත දැක්වෙන ආකාරයට කටයුතු කළ යුතුය.

i. සෑම කෙටි නාට්‍ය අත්පිටපතක්ම පිටපත් 03 කින් යුතුව එවීම අනිවාර්ය වේ.
ii. එසේ එවනු ලබන අත්පිටපත් යොමු කිරීමේදී A4 ප්‍රමාණයේ කඩදාසිවල තනි පැත්ත පමණක් භාවිතා කළ යුතු අතර, පරිගණකගත කර ඉදිරිපත් කළ යුතුය.
iii. අධ්‍යක්ෂවරයා පිටපත් රචකයා නොවන කල්හි අදාළ නාට්‍යය නිෂ්පාදනය කිරීම සඳහා පිටපත් රචකයාගෙන් නාට්‍යයේ අධ්‍යක්ෂ වෙත බලය පැවරුණු ලිපියක් ඉදිරිපත් කළ යුතු වේ.

**වෙනත්**

**වසරේ විශිෂ්ඨතම කෙටි නාට්‍යය ඉදිරිපත් කරන ආයතනයේ ආයතන ප්‍රධානියාටද විශේෂ ඇගැයුම් සම්මානයක් පිරි නැමේ.**

## 7 චිත්‍ර නිර්මාණ

7.1 තරග කොන්දේසි

7.1.1 චිත්‍ර ඇඳීම සඳහා තමා කැමති මාධ්‍යයක් භාවිතා කරමින් ඊට සුදුසු පෘෂ්ඨයක ( කඩදාසි/ බෝඩ්/ කැන්වස්) චිත්‍රණය කළ හැකි ය.

7.1.2. චිත්‍රය ප්‍රමාණය 18 X 14 විය යුතුය.

### 7.2 චිත්‍ර තරගය සඳහා පිරිනමන මුදල් තිළිණ හා සම්මාන

| තරග අංශය | ස්ථානය | ත්‍යාග මුදල (රු) |
|---|---|---|
| චිත්‍ර | ප්‍රථම ස්ථානය | 20,000.00 |
| | දෙවන ස්ථානය | 15,000.00 |
| | තෙවන ස්ථානය | 10,000.00 |
| | කුසලතා ස්ථාන 05 ක් බැගින් තෝරා ගනු ලැබේ. | එක් ජයග්‍රාහකයකුට 5000.00 බැගින් |

## 8 කෙටි චිත්‍රපට

### 8.1 තරග කොන්දේසි

8.1.1. තරගය සඳහා එක් අයදුම්කරුවකුට ඉදිරිපත් කළ හැක්කේ එක් චිත්‍රපටයක් පමණි.

8.1.2. එය ස්වතන්ත්‍ර නිර්මාණයක් විය යුතු අතර, මහජන ප්‍රදර්ශනයට සුදුසු කෙටි චිත්‍රපටයක් විය යුතුය.

8.1.3. එහි ධාවන කාලය අවම මිනිත්තු 05 ක් සහ උපරිම මිනිත්තු 15 අතර කාලයකට සීමා විය යුතුය.

8.1.4. එම කෙටි චිත්‍රපටය 2023/2024 වර්ෂයේ නිෂ්පාදනය කරන ලද්දක් විය යුතු අතර, ඊට පෙර වර්ෂවලදී කිසිදු තරගයක් වෙනුවෙන් හෝ මහජන ප්‍රදර්ශනය සඳහා හෝ ඉදිරිපත් නොකළ නිර්මාණයක් විය යුතුය.

8.1.5. මෙසේ තරගය සඳහා ඉදිරිපත් කරන කෙටි චිත්‍රපටය සිංහල හා දමිළ යන මාධ්‍ය භාෂා දෙකෙන් තමන් අභිමත භාෂා මාධ්‍යයකින් රූ ගත කර, පිටපත් තුනකින් DVD මාධ්‍ය තැටි මගින් පමණක් ඉදිරිපත් කළ යුතුවේ. (අදාළ තැටිවල ධාවන තත්වය පිළිබඳ වගකීම තරගකරුවන් සතුවේ)

8.1.6. කෙටි චිත්‍රපටයේ රංගනය, කලා අධ්‍යක්ෂණය, කැමරා අධ්‍යක්ෂණය, සංගීත අධ්‍යක්ෂණය, සංස්කරණය, අංග රචනය හා වස්ත්‍ර නිර්මාණය සහ නිෂ්පාදනය යන අනුෂංගික අංශ සඳහා පමණක් රාජ්‍ය සේවයට අයත් නොවන පුද්ගලයන් යොදවා ගැනීමට අවසර ඇත.

8.1.7. කෙටි චිත්‍රපටයේ අධ්‍යක්ෂණය හා රචනය රාජ්‍ය සේවයට අයත් පුද්ගලයකු විසින් සිදු කල යුතුය.

8.1.8. නිර්මාණය සඳහා මූලික වියදම් තරගකරුවන් විසින් දැරිය යුතු අතර, අනුග්‍රාහකයකු යොදා ගැනීමට අවසර ඇත.

### 8.2 කෙටි චිත්‍රපට තරගය සඳහා පිරිනමන මුදල් තිළිණ හා සම්මාන

| අනු අංකය | ස්ථානය | ත්‍යාග මුදල (රු) |
|---|---|---|
| 7.2.1 | ප්‍රථම ස්ථානය | 20,000.00 |
| 7.2.2 | දෙවන ස්ථානය | 15,000.00 |
| 7.2.3 | තෙවන ස්ථානය | 10,000.00 |
| 7.2.4 | කුසලතා ස්ථාන 05 ක් බැගින් තෝරා ගනු ලැබේ. | එක් ජයග්‍රාහකයකුට 5000.00 බැගින් |

## 9 <u>ඡායාරූප</u>

### 9.1 <u>තරග කොන්දේසි</u>

9.1.1 මෙසේ ඉදිරිපත් කරනු ලබන ඡායාරූප සංස්කරණය කළ නොහැකි අතර, ඒවායේ ස්වභාවික පෙනුමට හානි නොවන ලෙස දිග, පළල හා ආලෝක තීව්‍රතාව සකස් කළ හැකිය.

9.1.2 එක් තරගකරුවකුට තරගය සඳහා ඉදිරිපත් කළ හැකි උපරිම ඡායාරූප ප්‍රමාණය 03 කි.

9.1.3 ඡායාරූපයේ ප්‍රමාණය 18 X 15 විය යුතුය

9.1.4 කෘතියේ අන්තර්ගතයට අදාළ නොවන බාහිර සලකුණු කිසිවක් එනම්, දිය සලකුණු, නම්, දින සලකුණු හා ලාංජන ආදිය ඡායාරූපයේ අඩංගු වේ නම් එම ඡායාරූප තරගයෙන් ඉවත් කරනු ලැබේ.

9.1.5 සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් ඉල්ලා සිටින ඕනෑම මොහොතක තරගය සඳහා ඉදිරිපත් කරන ඡායාරූපවල සංස්කරණය නොකර ලද මුල් ගොනුව ( RAW හෝ JPEG) ලෙස ඉදිරිපත් කිරීමට ඡායාරූප ශිල්පියා බැඳී සිටිය යුතුය. එසේ ඉදිරිපත් කිරීමට අපොහොසත් වන සහ ප්‍රමාද වන ඡායාරූප තරගයෙන් ඉවත් කිරීමට හෝ ජයග්‍රාහණය ලබා නොදීමට විනිශ්චය මණ්ඩලය තීරණය කරනු ඇත.

9.1.6 තරගයට ඉදිරිපත් කරන සියලුම ඡායාරූප අදාළ ශිල්පියා විසින්ම ලබා ගන්නා ලද ඡායාරූප විය යුතුය. එහි බුද්ධිමය දේපළ අයිතිය සහ නිරූපණ හිමිකම පිළිබඳ නෛතික ගැටළුවක් මතු වුවහොත් ඒ සම්බන්ධයෙන් සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය කිසි ලෙසකින් වගකීමට බැඳී නොසිටිනු ඇත.

9.1.7 එසේම එම ඡායාරූප මින් පෙර කිසිදු තරගයක් වෙනුවෙන් හෝ මහජන ප්‍රදර්ශනය සඳහා හෝ ඉදිරිපත් නොකළ ඡායාරූප විය යුතුය.

### 9.2. <u>ඡායාරූප තරගය සඳහා පිරිනමන මුදල් තිළිණ හා සම්මාන</u>

| අනු අංකය | ස්ථානය | ත්‍යාග මුදල (රු) |
|---|---|---|
| 9.2.1 | ප්‍රථම ස්ථානය | 20,000.00 |
| 9.2.2 | දෙවන ස්ථානය | 15,000.00 |
| 9.2.3 | තෙවන ස්ථානය | 10,000.00 |
| 9.2.4 | කුසලතා ස්ථාන 05 ක් බැගින් තෝරා ගනු ලැබේ. | එක් ජයග්‍රාහකයකුට 5000.00 බැගින් |

1. වැඩිදුර තොරතුරු www.cultural.gov.lk වෙබ් අඩවියෙන් සහ ප්‍රවර්ධන අංශය දුරකතන අංක 011-2861325 / මහේෂා ඒකනායක 0718249272 නලින් සම්පත් කරුණාසේන 0716433390 / අමතා විමසා ලබා ගත හැකිය.


තිලක් නන්දන හෙට්ටිආරච්චි
අතිරේක ලේකම් (සංස්කෘතික ප්‍රවර්ධන)

අත්.කළේ - එච්.එම්.බී.හේරත්
ලේකම්, බුද්ධශාසන, ආගමික හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

දු.ක - 0112-872020
ෆැක්ස් - 0112-879088
ඊමේල් - intergov7@gmail.com

**බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය**
**අන්තර් රාජ්‍ය සේවක නිර්මාණ තරඟාවලිය - 2024**
**අයදුම්පත්‍රය**

ඇ. නිර්මාණකරුගේ පෞද්ගලික තොරතුරු -

1. සම්පූර්ණ නම - ..........................................................................................................
..............................................................................................................................
2. සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) ..................................................................
..............................................................................................................................
3. පෞද්ගලික ලිපිනය -....................................................................................................
..............................................................................................................................
..............................................................................................................................
4. දුරකතන අංකය - .......................................................................................................

ආ. නිර්මාණකරුගේ ආයතනික තොරතුරු -

5. ආයතනය
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................
6. ආයතනය අයත් පළාත -.................................................................................................
7. දිස්ත්‍රික්කය - ...........................................................................................................
8. තනතුර - ..................................................................................................................
9. කාර්යාලීය ලිපිනය - ..................................................................................................
..............................................................................................................................
..............................................................................................................................
10. කාර්යාලීය දුරකතන අංකය - .....................................................................................
11. කාර්යාලීය ෆැක්ස් අංකය - ........................................................................................

ඇ. නිර්මාණ පිළිබඳ තොරතුරු -

| | | |
|---|---|---|
| ☐ කෙටි කතා | ☐ ගීත රචනා | ☐ පද්‍ය රචනා |
| ☐ ළමා සාහිත්‍ය නිර්මාණ | ☐ කෙටි නාට්‍ය | ☐ චිත්‍ර නිර්මාණ |
| ☐ කෙටි චිත්‍රපට | ☐ ඡායාරූප | |

නිර්මාණයේ නම - ..........................................................................................................

ඉහත නම් සඳහන් කෙටි කතා, ගීත රචනා, පද්‍ය රචනා, ළමා සාහිත්‍ය නිර්මාණ, කෙටි නාට්‍ය, චිත්‍ර නිර්මාණ, කෙටි චිත්‍රපට හා ඡායාරූප ස්වතන්ත්‍ර නිර්මාණ වන බවත්, මෙම තරඟාවලියේ තරඟ කොන්දේසි ම විසින් පිළිපදින බවත්, එම කොන්දේසි හා එකඟ වන බවත් මෙයින් ප්‍රකාශ කරමි.

දිනය - ........................................................ අත්සන - ........................................................

නම - ........................................................

ඇ. ආයතන ප්‍රධානියාගේ නිර්දේශය -

මෙම ආයතනයේ සේවය කරන ......................................................................................................

මයා / මිය / මෙය විසින් ඉදිරිපත් කර ඇති කෙටි නාට්‍ය ඔහුගේ / ඇයගේම නිර්මාණයක් බව සහතික කරන අතර, අවශ්‍ය කටයුතු සඳහා මේ සමඟ ඉදිරිපත් කරමි.

දිනය - ................................ ආයතන ප්‍රධානියාගේ අත්සන - ...................................................

නිල මුද්‍රව - ......................................................